



# ආණ්ඩුව ටිරාන් අලස් දාපු වැලේ එල්ලිලා ගොඩ ආවා

## ජෙනරල් සරත් ෆොන්සේකා සන්නස සමග සාකච්ඡාවක

සටහන හා සේයාරූ
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

හිටපු යුද්ධහමුදාපති ජෙනරල් සරත් ෆොන්සේකා සමඟ කළ සාකච්ඡාව

**ජෙනරල් දේශපාලනයට ප්‍රවේශවීමේ ඉඳලා සිරභාරයට පත්වීම දක්වා කාලය තුළ ගමන් කළ දේශපාලන මාවත පැහැදිලි එකක්. නමුත් ජනාධිපතිවරයාගේ විශේෂ සමාවක් ලබා, සිරෙන් නිදහස ලැබීමෙන් පසු දේශපාලන ගමන් මග එතරම් පැහැදිලි බවක් දක්නට නැහැ. නිදහසින් පසු ඔබ යන මේ දේශපාලන ගමන මොකක්ද?**
මම යන්නේ ප්‍රතිපත්ති දේශපාලන ගමනක්. මේ ආණ්ඩුවත් එක්කලා එකතුවෙලා දේශපාලනය කරන්න මගේ කිසිම අදහසක් නෑ. ආණ්ඩුවේ තියෙන්නේ රටට අහිතකර දූෂිත දේශපාලන සංස්කෘතියක්. පවුල්වාදය කරපින්නාගෙන හැමතැනම දූෂණය, මර්ධනය රජකරන ස්ත්‍රී දූෂකයන්ට, පාතාල කල්ලිවලට තැන දීලා තියන දේශපාලන සංස්කෘතියක්. ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න යන ගමනක් තමයි මම යන්නේ. සදාචාරාත්මක, ජනතාවගේ ස්වාධිපත්තිය රැකෙන, නීතියේ ආධිපත්‍ය රැකෙන, අයුක්තිය අසාධාරණය නැති, ප්‍රජාතන්ත්‍රවාදය රැකෙන දේශපාලන සංස්කෘතියක් රටට ගෙනෙන්නයි යන්නේ. ආණ්ඩුව ඒ ගමන යන්නේ නැති නිසා තමයි මම වෙනම පැත්තකින් ඒ ගමන යන්න හදන්නේ. මේ ගමන යනකොට මම විපක්ෂයේ ඔක්කොටම කියන්නේ අපි එකතුවෙමු කියලා.

**ඔබ නියෝජනය කරන්නේ විපක්ෂයේ එක් කුඩා පක්ෂයක්. ඔබ යෝජනා කරන්නේ ඔබගේ නායකත්වය යටතේ එක්සත් ජාතික පක්ෂයත් ඇතුළුව විපක්ෂයේ සෙසු පක්ෂවලට එකතුවෙන්න කියලාද?**
ඡන්ද ලක්ෂ 140ක් තියන රටක විපක්ෂයේ ප්‍රධාන දේශපාලන පක්ෂය එක්සත් ජාතික පක්ෂයට අද හිමිවෙලා තියෙන්නේ ඡන්ද ලක්ෂ 20ක් පමණ ප්‍රමාණයක්. මේ යන විදිහට මට හිතෙන්නේ ඕකත් අඩුවෙයි කියලයි. මම ඉදිරිපත් කරන ප්‍රතිපත්ති හරියි කියලා හිතනවා නම් ඒ අයටත් පුළුවන් මම කියන මේ මාර්ගයට එකඟවෙන්න. එතනදි කවුද මේකට නායකත්වය දෙන්නේ, විපක්ෂ නායකයා කවුද කියන එක තීරණය කරන්න ජනතාවට ඉඩ දෙමු. ආණ්ඩුවට හම්බවෙලා තියනවා ලක්ෂ 50ක ඡන්ද. හම්බ නොවෙච්ච ඡන්ද ලක්ෂ 90 ආණ්ඩුවට විරුද්ධව ගොඩනගන්නයි මට ඕනේ. විපක්ෂයේ අපි ඔක්කොම එකතුවුණාම මේ වැඩේ ඉක්මනට කරන්න පුළුවන් කියන එකයි මම කියන්නේ.

**ඔබ එහෙම යෝජනා කළාට අපි දීර්ඝ කාලයක් තිස්සේම අත්දැකලා තියන ප්‍රායෝගික සත්‍ය තමයි ඉතාම තීරණාත්මක අවස්ථාවකදී පවා විපක්ෂයේ සියලු පක්ෂ එකට එකතුවීම කියන දේ සිද්ධවෙලා නැති බව. ඒ වගේම දිගින් දිගටම ආණ්ඩු බලය මාරුවීම සිද්ධවෙලා තියෙන්නේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක අතර තට්ටුමාරු ක්‍රමයට. ඒවගේ පසුබිමක ඔබගේ ඔය යෝජනා කොයි තරම් ප්‍රායෝගික ඒවාද?**
ඔය කියන ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකටම ලැබුණ ඡන්ද ප්‍රමාණය ලක්ෂ 70යි. මේ දෙකට නැති තවත් ඡන්ද ලක්ෂ 70ක් රටේ තියනවානේ. එතකොට කවුරුත් තීන්දු කරන්න අවශ්‍ය නෑනේ මේ දෙකට තියන ඡන්ද ලක්ෂ 70න්ම තමයි මේක වෙන්න ඕනේ කියලා. තව ලක්ෂ 70ක් තියනවා මේ දෙක ප්‍රතික්ෂේප කළ. අනික මේ රටේ ඔය ප්‍රායෝගික කියන ක්‍රමය අවුරුදු පනහක් තිබුණානේ. නොයෙක් නොයෙක් ජන නායකයෝ අපි මේවා කරා, අරව කරා කියලා පුරසාරම් දෙඩුවට රට දියුණුවෙලා නෑනේ. එහෙම නම් අපි තීන්දුවක් තීරණයක් ගන්න ඕනේ මේ ක්‍රමයෙන්ම තවදුරටත් රට අගාදයට රැගෙන යනවද, මේ ක්‍රමය වෙනස් කරලා රට දියුණු කරනවද කියලා. ජනතාව තමයි ඒක තීරණය කරන්න ඕනේ. අපි අවුරුදු පනහක් වළක වැටිලා හිටියා කියලා අපි හිතාගන්න ඕනේද මේකෙන් එළියට ඒමක් නෑ. අපි මේ වළේම ඉන්න ඕනේ කියලා. ඔය වගේ වළවල හිටපු වෙනත් රටවල් ගොඩට ඇවිල්ලා තියනවානේ. අද හරි මාර්ගයේ ගමන් කරනවානේ. දියුණුවෙලා තියනවානේ. ඒ රටවල් දියුණු වෙනකොට අපි සාපේක්ෂව දියුණුවෙලා නෑනේ. නිදහස ලැබෙන කොට රුපියල් දෙකට තිබුණ ඩොලර් එක දැන් රුපියල් එකසිය තිස්පහක් වෙලානේ. මේකට තියන විකල්පය මේ ක්‍රමය වෙනස් කරන එකයි. ඒක කරන්න නම් දේශපාලන සංස්කෘතිය වෙනස් වෙන්න ඕනේ.

**ඒ දේ කරන්න ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකට විකල්ප තුන්වෙනි ධාරාවේ දේශපාලන බලවේගයකට ඔබ නායකත්වය දෙනවා කියන එකද ඔබ කියන්නේ ?**
තුන්වෙනි ධාරාවක් ගැන නෙවෙයි මම කතා කරන්නේ. මේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකට ඡන්ද ලක්ෂ 70ක් තියනවා. ඒ දෙකට නැති ඡන්ද